ජාතික අධ්‍යාපන ආයතනය - 2021

-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

ජාතික අධ්‍යාපන ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනයේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සම්බන්ධයෙන් විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළදී ආයතනයට ලැබී තිබුණු රු.176,008,097 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය වාර්තාවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කිරීමට පියවර ගනිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිමකර තිබූ ව්‍යාපෘති 04 කට අදාළ එකතුව රු.1,801,121 ක් වූ අතරැඳවුම් මුදල් ප්‍රාග්ධනිත කිරීමකින් තොරව කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් හා කෙරීගෙන යන වැඩ වටිනාකම වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2022 වර්ෂයට අදාළ මූල්‍ය වාර්තාවල අදාළ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | නිම කරන ලද ව්‍යාපෘතිවලට අදාළ අත රැඳවුම් මුදල් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආයතනය විසින් අනුගමනය කරනු ලබන ගිණුම් ප්‍රතිපත්තිය අනුව පාඨමාලා ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කරන බව දක්වා තිබුණ ද පාඨමාලා ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි. නියැදි පරීක්ෂාවට භාජනය කරන ලද පාඨමාලා 02 ක සමාලෝචිත වර්ෂයට අදාළ පාඨමාලා ආදායම රු. 6,968,250 ක් වුවද 2020 හා 2022 වර්ෂ වෙනුවෙන් ලැබී තිබූ එකතුව රු.4,488,750 ක පාඨමාලා ගාස්තු සමාලෝචිත වර්ෂයට ගලපා තිබීම නිසා රු.11,457,000 ක් වර්ෂයේ පාඨමාලා ආදායම් ලෙස මූල්‍ය | ආයතනය මඟින් පවත්වනු ලබන විවිධ පාඨමාලා සඳහා ගුරු සිසුන් ගාස්තු ගෙවීම් කරනු ලබන්නේ ලංකා බැංකුවේ ජාතික අධ්‍යාපන ආයතනය නමින් ඇති ගිණුම හරහාය. ඒ අනුව ආයතනය විසින් පාඨමාලා ආදායම් ගිණුම්ගත කිරීම කරනු ලබන්නේ බැංකුවෙන් ලැබෙන බැංකු ගිණුම් විස්තරය අනුව ලැබී ඇති තොරතුරු හා රිසිට් පත් අනුවය. | ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව පාඨමාලා ආදායම ගිණුම්ගත කළ යුතුය. |

ප්‍රකාශනවල දක්වා තිබුණි.

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී මිලදීගෙන තිබූ පිරිවැය රු.3,027,020 ක් වූ පරිගණක මෘදුකාංගයේ වටිනාකම අස්පෘෂ්‍ය වත්කම් යටතේ ප්‍රාග්ධනීත කිරීම වෙනුවට වර්ෂයේ වියදමක් ලෙස කපාහැර තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයේ ආදායම ඉක්මවූ වියදම වැඩියෙන් හා අස්පෘෂ්‍ය වත්කම් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අතපසුවීමකින් වියදමක් ලෙස ගිණුම්ගත කර ඇති අතර මෙය 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජ 'නල් සටහන් මඟින් නිවැරදි කරනු ලැබේ. | මිලදී ගනු ලබන පරිගණක මෘදුකාංගවලට අදාළ පිරිවැය අස්පෘෂ්‍ය වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ viii වන පරිච්ඡේදයේ10.1 වගන්තිය | ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව ජාතික අධ්‍යාපන ආයතනය මගින් නිකුත් කරන ලද 1996 මාර්තු 26 දිනැති අංක 179 දරන අභ්‍යන්තර චක්‍රලේඛයක් පදනම් කරගෙන දළ වැටුප මත 1/20 දීමනා ගෙවා තිබුණි. | ජාතික අධ්‍යාපන ආයතනයේ සේවයේ නියුතු මාණ්ඩලික නිලධාරීන්ට රජයේ නිවාඩු දින හා සති අන්ත දිනවල සේවයේ යෙදීම සම්බන්ධයෙන් දීමනා ගෙවීමේදී ජාතික අධ්‍යාපන ආයතනයේ පාලන හා මුදල් සංග්‍රහයේ 6 වන පරිච්ඡේදයේ 17.5 වගන්තියේ සඳහන් ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කර ඇත. | විධිමත් අනුමැතියක් නොමැති පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහයට අනුකූලව ගෙවීම් නොකළ යුතු අතර ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන පනතේ 4 (ක) සහ 28 වගන්ති | සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ආයතනයේ පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහය අනුමත කරගෙන නොතිබුණි. | ජාතික අධ්‍යාපන ආයතනයේ පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහය මේ වන විට කෙටුම්පත් කිරීම අවසන් අදියරේ පවතින අතර ඒ අනුව එම කෙටුම්පත ඉතා කඩිනමින් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ. | ජාතික අධ්‍යාපන ආයතනය පිහිටුවීමේ පනත අනුව පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහය අනුමත කරගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 72,631,933 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 124,084,044 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 196,715,977 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට නඩත්තු හා ගිවිසුම්ගත සේවා වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික අධ්‍යාපන ආයතනයේ අනුමත කාර්යමණ්ඩලය තුල ඇති නීති නිලධාරි තනතුර පුරප්පාඩු වී පැවතිය දී අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් නොවන නීති සම්බන්ධීකාරක තනතුර සඳහා 2020 නොවැම්බර් 02 දින සිට නිලධාරියෙකු පත්කර තිබූ අතර ඔහු වෙනුවෙන් එදින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.952,550 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | ආයතනයේ සේවයේ නියුතුව සිටි නීති නිලධාරි 2020.11.01 දින සිට විශ්‍රාම ගැනීම හේතුවෙන් නව නිලධාරියෙකු බඳවාගෙන ආයතන විසින් එම නීති කෘත්‍යයන් නිසි ලෙස නව නිලධාරියාට පවරා දෙන තෙක්, එම කටයුතු භාරව ක්‍රියාකළ නීතිඥවරයා නීති සම්බන්ධීකාරක ලෙස සේවය ලබා ගෙන එම දිනයන් සඳහා පමණක් ගෙවීම් කිරීම යටතේ එම සේවය ලබා ගැනීමට කටයුතු කර ඇත. | අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා පමණක් බඳවා ගෙන වැටුප් හා දීමනා ගෙවිය යුතුය. |
| (ආ) | දෙස් විදෙස් ගුරු සිසුන් 100 දෙනෙකුට නේවාසික පහසුකම් ලබා දීමේ අරමුණින් 2015 අයවැය යෝජනාවක් මත රු.මිලියන 198 ක ඇස්තමේන්තු පිරිවැයකින් යුක්තව ඉදිකරගෙන යනු ලබන මීපේ දකුණු ආසියානු ගුරු සංවර්ධන මධ්‍යස්ථානයේ නේවාසිකාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2019 දෙසැම්බර් 05 දින වන විට නිමකළ යුතුව තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විට අවස්ථා 06 කදී දින දීර්ඝ කිරීම් ලබා දි තිබියදී වාර්තාවේ දිනය දක්වාම ඉදිකිරීම් කටයුතු නිම කර නොතිබුණි. තවද මෙම ඉදිකිරීම් කටයුතු කරගෙන යාම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය වාර්තාවේ දිනය දක්වා ලබා ගෙන නොතිබුණි. | එවකට රටතුළ පැවති ඉදි කිරීම් ක්ෂේත්‍රයේ බිඳ වැටීමත් ඉන් අනතුරුව රට තුළ පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් කම්කරුවන් අවශ්‍ය ප්‍රමාණයට වැඩබිම වෙත සැපයීමේ අපහසුතා යන හේතු නිසා මේ දක්වා නියමිත ඉදි කිරීම් නිම කිරීමට කොන්ත්‍රාත්කරු අසමත් වී ඇත. එසේම දැනට ද රට තුළ පවතින අමු ද්‍රව්‍ය හිඟය නිසා අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටළුකාරී තත්ත්වය හේතුවෙන් සම්පූර්ණයෙන් මේ දක්වා නිම කර ගැනීමට නොහැකි වී ඇති අතර භෞතික ප්‍රගතිය මේ වන විට 93% ක මට්ටමේ පවතී. | ගිවිසුම්ගත කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘති නිම කර අදාළ අරමුණු කෙරෙහි යෙදවීමටත් ව්‍යාපෘතිය කරගෙන යාම සඳහා විධිමත් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 හා 2019 වර්ෂයන්ට අදාළව පර්යේෂණ ප්‍රදාන 09 ක් වෙනුවෙන් රු.8,020,000 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද පර්යේෂණ ප්‍රදාන 07 ක් වෙනුවෙන් රු.2,274,970 ක් පමණක් වැය කර තිබුණි. | 2017 වර්ෂයේ දී පුවත්පත් දැන්වීම් පළ කර අයදුම්පත් 09 ක් ලැබුණු අතර සුදුසුකම් ලැබූ තිදෙනෙකුට 2017 වර්ෂයේ දෙසැම්බර් මස ආයතනය සමඟ ගිවිසුම් අත්සන් කරන ලදී.<br>එක් පුද්ගලයෙකු වසරකින් හා අනෙක් පුද්ගලයින් දෙදෙනා වසර දෙකකින් පර්යේෂණ නිම කළ යුතු විය. ඒ අනුව ඔවුනට හිමි පළමු අදියරේ ගෙවීම පමණක් 2017 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී ලබා දෙන ලදී. 2019 වර්ෂයේදී පර්යේෂණ ප්‍රදාන 04 ක් ලබා දුන් අතර ඔවුන් සිය පර්යේෂණ 2019 වර්ෂයේ සැප්තැම්බර් මස ආරම්භ කර 2020 සැප්තැම්බර් මස නිම කළ යුතු වුවත් රටේ පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය මත දත්ත රැස් කිරීමේ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් ඔවුන්ගේ පර්යේෂණ නිමකර වාර්තා ආයතනය වෙත භාරදෙන ලද්දේ 2021 වර්ෂයේ දීය. | වර්ෂයට අදාළව සළසනු ලබන ප්‍රතිපාදන වර්ෂය තුළ උපරිම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |